# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1771/5 – 2012 අගෝස්තු 14 වැනි අඟහරුවාදා – 2012.08.14

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබාගැනීමට රජය අදහස් කරන බැවි, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබාගැනීමට බලාපොරොත්තු වන ඉඩමේ විස්තර:

වයඹ පළාතේ පුත්තලම දිස්ත්‍රික්කයේ, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ආනවිළුන්දන් පත්තුවේ කුම්බුටුකුලිය ගමේ පිහිටි පුත්තලම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි විසින් මැන සකස් කරන ලද මුපිපු 5010 පිඹුරේ කට්ටි අංක 01 වශයෙන් නිරූපිත ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.2026ක් වූ කුම්බුටුකුලියවත්ත හෙවත් සව්සිරි උයන නමැති ඉඩම් කොටසට මායිම්.

උතුරට: ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව හිමිකම් කියන කුම්බුටුකුලිය වත්ත හෙවත් සව්සිරි උයන; නැගෙනහිරට සහ දකුණට: ප්‍රාදේශීය සභා මාර්ගය; බටහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය හා ආරච්චිකට්ටුව ප්‍රාදේශීය සභාව හිමිකම් කියන කුම්බුටුකුලිය වත්ත හෙවත් සව්සිරි උයන.

ඉහත සඳහන් ඉඩමට හිමිකම් අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2012 ඔක්තෝබර් මස 10 වැනි දින, පූ.භා. 10.00 ට, ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුයි.

තවද, 2012 සැප්තැම්බර් මස 26 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත්, මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතුයි.

එච්. එස්. එස්. ලුසේනා,
ප්‍රාදේශීය ලේකම්,
ආරච්චිකට්ටුව.

2012 අගෝස්තු මස 09 වැනි දින,
ආරච්චිකට්ටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී ය.

08 – 802

---

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

අංක 1705/30 හා 2011.05.13 දින දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තිය යටතේ පළවූ දැන්වීමේ 3A පිටුවේ සඳහන් කැබලි අංක 462හි ඉඩමේ ප්‍රමාණය හෙක්ටයාර් 0.0022ක් ලෙස සංශෝධනය විය යුතු බව මෙයින් දන්වා සිටිමි.

**කැබලි අංක 462**
ඉඩමේ නම: කැත්තපහුවේ මහකුඹුර; ප්‍රමාණය: හෙක්. 0.0022.

ඩබ්ලිව්. එස්. සේනාතිස්ස,
ප්‍රාදේශීය ලේකම්.
අඹන්පොල.

2012 අගෝස්තු මස 10 වැනි දින,
අඹන්පොල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 789

සංශෝධනයයි

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීමයි

මගේ අංකය: බිය3/1/1/3805/01.

වර්ෂ 2011 ඔක්තෝබර් මස 25 වැනි දින අංක 1729/11 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීමේ සඳහන් මු.පි.ගම් 3805 දරන පිඹුරේ කැබලි අංක 01 දරන ඉඩම් කැබැල්ල මහර ප්‍රාදේශීය ලේකම් වෙත නිකුත් කර ඇති අතර එය බියගම ප්‍රාදේශීය ලේකම් ලෙස සංශෝධනය විය යුතුය.

**කැබලි අංක 01**

ඉඩමේ නම: මිල්ලගහවත්ත (වරි. අංකය සොයාගත නොහැක); විස්තරය: මාර්ගය; හිමිකම් කියන අය: දොන් මාකස් බියන්විල, අංක 64/1, ඒ, රන්රස, පහළ බියන්විල, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0023.

ටී. ඩී. එස්. පී. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්.
බියගම.

2012 ජූනි මස 14 වැනි දින,
බියගම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,
සපුගස්කන්ද,
මාකොළ.

08 - 801